## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - 2018

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් හා සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**
-------------------

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**
-------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2** | | |
| (i) ප්‍රමිතයේ 09 ඡේදය ප්‍රකාරව, පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට තොග මැනිය යුතු වුවද, 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරි නිමි ඖෂධ තොගය එහි පිරිවැයට මැන තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 ප්‍රකාරව කටයුතු කළ යුතුය. මෙම වරද නිවැරදි කර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ii) ප්‍රමිතයේ 10 සිට 15 දක්වා වූ ඡේද ප්‍රකාරව, නිමි ඖෂධ ඉතිරි තොගයේ පිරිවැයට, තොග මිලදී ගැනීමට අදාළ සියළු පිරිවැය, පරිවර්තන පිරිවැය හා තොග වත්මන් ස්ථානයට හා තත්ත්වයට ගෙන ඒමට දරන ලද අනෙකුත් පිරිවැය ඇතුළත් කළ යුතු වුවද, ඒ වෙනුවට 2016 වර්ෂයේ එක් එක් ඖෂධයේ පිරිවැයට සියයට 3 ක් එකතුකර ලැබෙන අගය පදනම් කර ගනිමින් 2018 ජනවාරි 01 දිනට ඉතිරි නිමි ඖෂධ තොගයේ පිරිවැය රු.119,683,119 ක් ලෙස ගණනය කර ගිණුම් ගත කර තිබුණි. | 2016 වර්ෂයේ සමස්ථ පිරිවැය සියයට 3 කින් ඉහළ ගොස් ඇති බව හා තොග පිරිවැය සියයට 3 කින් වැඩි කළ බව. | ඉහත පරිදි |

| | | | |
|---|---|---|---|
| (iii) | 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරි නිමි ඖෂධ තොගයේ ඇතුළත් ඉකුත් වර්ෂවල නිෂ්පාදනය කර තිබුණු තොග ඒවායේ සත්‍ය පිරිවැයට අගය කර නොතිබුණු අවස්ථා වූ අතර ඒ වෙනුවට 2018 වර්ෂයේදී නිෂ්පාදනය කළ ඖෂධවල පිරිවැය පදනම් කර ගෙන අගය කර තිබුණි. | 2017 සහ 2018 වර්ෂ වල සීමිත වැඩපත් පත්‍රිකාවල පිරිවැය පමණක් පරිගණකයට ඇතුළත් කර ඇති බව, අලෙවි මධ්‍යස්ථාන පරිගණක ගතකර නොමැති නිසා 2017, 2018 වර්ෂවල නිෂ්පාදන, ඒවායේ පිරිවැය සමඟ ඍජුව හඳුනාගැනීමක් කළ නොහැකි බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 2 ප්‍රකාරව කටයුතු කළ යුතුය. මෙම වරද නිවැරදි කර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (iv) | පවත්වා තිබුණු ගබඩා තොග පොත්වලට අනුව 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරි නිමි ඖෂධ ඒකක ප්‍රමාණය හෝ එහි පිරිවැය ගණනය කර නොතිබුණි. ඒ වෙනුවට එදිනට භෞතික ඉතිරි නිමි ඖෂධ තොගයේ පිරිවැය වූ රු.91,124,985 ක් ගිණුම් ගත කර තිබුණි. ඒ හේතුවෙන් ප්‍රමිතයේ 34 ඡේදය ප්‍රකාරව, එදිනට තොග ඌනතා හා අතිරික්තතා මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි. | 2018 දෙසැම්බර් 31 දිනට තොගයේ අගය ලෙස භෞතික තොගයේ අගය ඇතුළත් කර ඇති බව, ඒ හේතුවෙන් තොග ඌනතා සහ අතිරික්තතා මත ඇති වන බලපෑම ගිණුම්ගත වී ඇති බව. | ඉහත පරිදි |
| (v) | ප්‍රමිතයේ 36 ඡේදය ප්‍රකාරව, 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරි නිමි ඖෂධ තොගයේ පිරිවැය ලෙස ගිණුම්ගත කර තිබුණු රු.91,124,985 ක් ගණනය කිරීමේදී භාවිතා කළ පිරිවැය සූත්‍රය, යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා භෞතික ඉතිරි තොගයේ පිරිවැය තුළ ඇතුළත් රු.6,370,745 ක හානි වූ තොගයේ පිරිවැය හෙළිදරව් කර නොතිබුණි. | ප්‍රමිතයේ 36 වන ඡේදය ප්‍රකාරව, සියළු හෙළිදරව් කිරීම් 2019 මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කරන බව. | ඉහත පරිදි |
| **(ආ)** | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 හි 42 ඡේදය ප්‍රකාරව, ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි, වරද සිදු වූ කාලච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතානුයෝගීව නිවැරදි කළ යුතු වුවද, එසේ නොකර පෙර වර්ෂ වැරදි නිවැරදි කිරීම සඳහා රු.3,256,967 ක් 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අයිතම 02 කට ගැලපීම් කර තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව කටයුතු කළ යුතුය. මෙම වරද නිවැරදි කර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වියදම වූ රු.6,872,474 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු නමුත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 හි 76 ඡේදය ප්‍රකාරව, එම වටිනාකම ගණනය කිරීමට අදාළ මරණ අනුපාතය, සේවක පිරිවැටුම, පූර්ව විශ්‍රාමයාම, දුබලතාවයන්, වට්ටම් අනුපාත, වෛද්‍ය සැලැසුම් යටතේ වූ හිමිකම් අනුපාත හා වෛද්‍ය ප්‍රතිලාභ ආදී වූ ආයුගණක උපකල්පන හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව, සියළු හෙළිදරව් කිරීම් 2019 මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ප්‍රකාරව කටයුතු කළ යුතුය. මෙම වරද නිවැරදි කර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 හි 17 ඡේදය ප්‍රකාරව, සංස්ථාවේ ඉහළ කළමනාකරණය වෙත ගෙවන කෙටි කාලීන සේවක ප්‍රතිලාභ වටිනාකම්, වෙනත් දිගුකාලීන ප්‍රතිලාභ වටිනාකම් සහ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභවල වටිනාකම් හෙළිදරව් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ඔවුන් වෙත ගෙවන ලද පාරිශ්‍රමිකවල වටිනාකම පමණක් හෙළිදරව් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 3:9 යටතේ ඉහළ කළමණාකරනය වෙත ගෙවන දිගුකාලීන හා කෙටිකාලීන ප්‍රතිලාභ මෙන්ම සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ හෙළිදරව් කර ඇති බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 ප්‍රකාරව කටයුතු කළ යුතුය. මෙම වරද නිවැරදි කර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් බදු වියදම රු.5,400,891 කින් හා 2018 දෙසැම්බර් 31 දිනට ආදායම් බදු වෙන් කිරීම රු.5,326,793 කින් වැඩියෙන් ගණනය කර ගිණුම් ගතකර තිබුණි. | 2018 වර්ෂයට අදාළ නිවැරදි ආදායම් බදු වියදම රු.11,723,197 ක් වන බව හා 2018 දෙසැම්බර් 31 දිනට ආදායම් බදු වෙන්කිරීමේ ගිණුමේ ශේෂය රු.11,141,005 ක් වන බව. | මෙම වරද නිවැරදි කරමින් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට ඉතිරි නිමි ඖෂධ වර්ග 17 ක පිරිවැය රු.3,385,881 ක් හා පිරිවැය ගණනය නොකළ නිමි ඖෂධ අයිතම 60 කට අදාළ ඒකක 21,763 ක පිරිවැය ගිණුම්ගත කර නොතිබුණි. | නිමි ඖෂධ වර්ග 17 ක පිරිවැය රු.3,385,881 ක් මගහැරී ඇති බව. | ඉහත පරිදි |
| (ඇ) | 2018 සැප්තැම්බර් 13 දින වන විට වැඩ අවසන් කර තිබුණු ඉදිකිරීමක් සඳහා වැයකර තිබුණු රු.2,799,618 ක් ප්‍රාග්ධනගත නොකර කෙරීගෙන | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙම වරද නිවැරදි කරන බව. | ඉහත පරිදි |

| | | | |
|---|---|---|---|
| | යන වැඩ ලෙස දක්වා තිබුණු අතර තවත් ඉදිකිරීමක් සඳහා වැයකර තිබුණු රු.1,409,696 ක් ප්‍රාග්ධනගත නොකර අයහාර වියදමක් ලෙස සලකා ගිණුම් ගත කර තිබුණි. | | |
| (ඇ) | අයිතිය සංස්ථාව සතු වූ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් තවදුරටත් භාවිතයට ගත හැකි මෝටර් රථ 05 ක පිරිවැය හා සමුච්චිත ක්ෂය ඉකුත් වර්ෂයේදී පොත්වලින් කපාහැර තිබීමේ වරද නිවැරදි කිරීම සඳහා රු.3,256,967 ක් වූ පිරිවැය හා සමුච්චිත ක්ෂය නැවත ගිණුම්ගත කර තිබුණු නමුත් එම වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. | නැවත ප්‍රත්‍යාගණනය කිරීම සඳහා විශාල මුදලක් ගෙවීමට සිදුවන බව. | මෙම වරද නිවැරදි කරමින් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය සඳහා ඉතුරුම් තැන්පත් පොලී රු.314,420 ක් ගිණුම්ගත කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ඉහත පරිදි |

### 1.5.3 **නොසැසඳු ගිණුම්**

| **විෂයය** | | **මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.මිලියන** | **අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.මිලියන** | **වෙනස රු.මිලියන** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|---|
| (අ) | විකුණුම් ආදායම | 675.87 | 679.44 | 3.57 | අලෙවි මධ්‍යස්ථාන 03 ක් හා ප්‍රාදේශීය කාර්යාලයක් විසින් සිදුකර තිබුණු ණයට විකුණුම් ගිණුම් ගත නොකළ බව. | සියළු විකුණුම් ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | මහජන බැංකු ණයවර ලිපි ගිණුම | 5.15 | 4.08 | 1.07 | ණයවර ලිපි ගිණුම හා උපලේඛනය අනුව වෙනසක් පවතින බව. | අනුරූපී වාර්තා සමඟ සැසඳීම් කර මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | ණයගැතියෝ | 190.92 | 190.72 | 0.20 | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | ඉහත පරිදි |
| (ඈ) | ක්ෂය | 6.05 | 7.44 | 1.39 | සැසඳීම් කර 2019 වර්ෂයේදී නිවැරදි කරන බව. | ඉහත පරිදි |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු.මිලියන | | | |
| ණයගැතියෝ<br>ණයහිමියෝ | 110.75<br>31.25 | ශේෂ සනාථ සහතික | ණයගැතියන් හා ණයහිමියන් වෙත ශේෂ සනාථ කිරීමේ ලිපි යොමුකර ඇති නමුත් ප්‍රතිචාර දක්වා නැති බව. | ශේෂ සනාථ සහතික නොඑවන ණයගැතියන් හා ණයහිමියන් සම්බන්ධයෙන් විශේෂ සොයා බැලීමක් සිදුකර අනන්‍යතාවය තහවුරු කර ගත යුතුය. |

**1.5.5 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට එකතු අගය රු.2,396,142 ක් වූ ණයගැති ශේෂ 15 ක් වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට රාජ්‍ය අංශයේ ආයතන 13 කින් අයවීම් හිඟ හිටි ණය ශේෂ වූ අතර ඉන් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගෙන නොතිබුණි. ඉන් එකතු අගය රු.1,379,850 ක් වූ ණය ශේෂ 04 කට අදාළ ණයගැතියන් විසින් සංස්ථාවට පියවීමට කිසිදු ශේෂයක් නොමැති බව දන්වා තිබුණි. | 2014 වර්ෂයට පෙර වර්ෂවල වගකීම්වලට බැඳි සිටි නිලධාරින් නොමැතිවීම නිසා ණයගැතියන් පිළිබඳ දත්ත ලබා ගැනීම අපහසුවී ඇති බැවින් මුදල් අයකර ගැනීමද අපහසුවී ඇති බව හා අයවිය යුතු ඉතිරි මුදල් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | ණය අයකර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදී ක්‍රියාත්මක කළ යුතුය. |

### 1.5.6 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට එකතු අගය රු.20,207,994 ක් වූ ණයහිමි ශේෂ 74 ක් මාස 14 කට වඩා වැඩි කාලයක සිට පියවා නොතිබුණි. | ඉන්වොයිස් සඳහා ගෙවීම් සිදුකර ඇතිද යන්න පිළිබඳව තහවුරු කරගැනීමට කටයුතු කරන බව. | ණයහිමියන් පිළිබඳ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් හඳුන්වා දී ක්‍රියාත්මක කළ යුතුය. |

### 1.6 තත්ත්කාර්ය අතුරු අග්‍රිම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි (5) 371ප්‍රකාරව, තත්ත්කාර්ය අතුරු අග්‍රිමය ලබා ගත් කාර්යය නිමවී දින 10 ක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත්, ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ නිලධාරීන් 06 දෙනෙකු වෙත නිකුත් කර තිබුණු රු.99,740 ක තත්ත්කාර්ය අතුරු අග්‍රිම 08 ක්, 2019 මාර්තු 31 දින වන විටද පියවා නොතිබුණු අතර ප්‍රමාද කාලය දින 10 සිට දින 150 දක්වා කාල පරාසයක් ගෙන තිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි (5) 371 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 103 හා 104 | සමාලෝචිත වර්ෂයේදී හානිවී තිබුණු බවට හඳුනාගෙන තිබුණු පිරිවැය රු.6,370,745 ක් වූ නිමි ඖෂධ පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර පාඩුව සඳහා වගකිව යුත්තන් නිශ්චය කිරීමට පරීක්ෂණ පවත්වා නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 84 වන වගන්තිය ප්‍රකාරව, අලෙවි මධ්‍යස්ථානයක කුලිය ලෙස ගෙවා තිබුණු මුදලින් සියයට 10 ක් එනම් රු.187,500 ක් රඳවුම් බදු ලෙස අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | රදවාගැනීමේ බදු ලෙස රු.187,500 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු කරන බව. | දේශීය ආදායම් බදු පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.9 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1997 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණු දිරි දීමනා ක්‍රමවේදය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු බවට 2007 නොවැම්බර් 09 දින පවත්වා තිබුණු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියම කර තිබුණි. නමුත් 2019 මාර්තු 28 දින වන විටත් එම අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර පසුගිය වර්ෂ පහකදී එලෙස ගෙවා තිබුණු මුළු දිරි දීමනාවල එකතු අගය රු.366,435,770 ක් විය.<br>මෙම දිරි දීමනා ක්‍රමය තුළ නිෂ්පාදන පිරිවැය මත පදනම්ව නිෂ්පාදන දිරිදීමනා, පැමිණීමේ දීමනා, ඉතිරි වෛද්‍ය නිවාඩු දීමනා හා ඵලදායීතා දිරිදීමනා වශයෙන් වර්ග 04 ක දිරි දීමනා ඇතුළත්ව තිබුණි. වෙළඳපල උද්ධමනකාරී තත්ත්වයක් තුළ නිෂ්පාදන පිරිවැය වාර්ෂිකව වැඩිවන බැවින් නිෂ්පාදන දිරිදීමනාවද වාර්ෂිකව වැඩි වන නිසා දිරි දීමනා ක්‍රමයකින් අපේක්ෂිත සේවක කාර්යක්ෂමතාවය වැඩි වේයැයි අපේක්ෂා කළ නොහැකිවේ.<br>තවද නිෂ්පාදන දිරිදීමනාව නිෂ්පාදනය ඉහළ නංවාලීම පිණිස සෘජුවම දායකත්වයක් නොසපයන අංශවල සේවකයින්ටද සමානව ගෙවන බැවින් එම අංශවල කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට එය අනුබලයක්වී නොතිබුණි. | නිෂ්පාදන හා අලෙවි අංශවල ඉලක්ක ළඟා කර ගැනීම පදනම්ව දිරි දීමනා ගණනය කිරීම සඳහා නව ක්‍රමවේදයක් මේ වන විට පිළියෙල කරමින් පවතින බව. | සියළුම අංශවල නිලධාරීන්ගේ කාර්යසාධන මට්ටම ඉහළ නංවන ආකාරයට දිරි දීමනා ක්‍රමය පිළියෙල කර විධිමත් අනුමැතිය ලබා ගැනීමෙන් පසුව දිරි දීමනා ගෙවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1987 නොවැම්බර් 19 දින සිට ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවට ආවේනික වූ පරිපාලනමය හා පාලන රෙගුලාසි ඇතුළත් කරමින් නිවාඩු කාර්යය පරිපාටියක් පිළියෙල කර ක්‍රියාත්මක කර තිබුණි. නමුත් ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. එබැවින් එම නිවාඩු කාර්යය පරිපාටිය වෙනුවට 2009 ජනවාරි සිට ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ අනෙකුත් අදාළ චක්‍රලේඛ භාවිතා කළ යුතු බව 2009 පෙබරවාරි 16 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. එසේ නමුත් ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ අනෙකුත් අදාළ චක්‍රලේඛ අනුගමනය නොකර ඒ වෙනුවට මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු නිවාඩු කාර්යය පරිපාටිය අනුව ඉතිරි කරන ලද වෛද්‍ය නිවාඩු සඳහා 2012 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා නිවාඩු දීමනා ලෙස එකතුව රු.23,151,940 ක් නිලධාරීන් හා සේවකයන් වෙත ගෙවා තිබුණි. | ආයතනයේ නිවාඩු කාර්ය පටිපාටිය හා විනය කාර්ය පටිපාටිය පිළියෙල කිරීමෙන් අනතුරුව වෛද්‍ය නිවාඩු ගෙවීම් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශයට හා භාණ්ඩාගාරයට ලිපි යොමු කර ඇති බව, 2018 වර්ෂයේ වෛද්‍ය නිවාඩු ගෙවීම්, භාණ්ඩාගාරයේ අනුමැතිය නොලැබුනහොත් ආපසු අය කර ගැනීමේ පදනම මත ගෙවා ඇති බව. | විධිමත් පරිපාලන සහ මූල්‍ය රෙගුලාසි සංග්‍රහයක් පිළියෙල කර මහා භාණ්ඩාගාරයේ සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අනුමැතිය ලබාගත යුතුය. මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු නිවාඩු කාර්යය පරිපාටිය අනුව ඉතිරි කරන ලද වෛද්‍ය නිවාඩු සඳහා ගෙවූ මුදල් ආපසු අයකර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.15,672,122 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.43,656,859 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.27,984,737 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙහෙයුම් වියදම් රු.35,184,513 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම සියයට 17 කින් වැඩිවී තිබුණද, විකුණුම් පිරිවැය සියයට 30 කින් වැඩිවී තිබුණි. වෙනත් ආදායම් හා ශුද්ධ මූල්‍ය ආදායම් පිළිවෙලින් සියයට 23 කින් හා සියයට 139 කින් වැඩිවී තිබුණු අතර මෙහෙයුම් වියදම් සියයට 40 කින් වැඩිවී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ දළ ලාභ අනුපාතය හා ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 6.47 කින් හා සියයට 5.23 කින් අඩුවී තිබුණි. එසේම ජංගම අනුපාතය 0.11 කින් හා ක්ෂණික වත්කම් අනුපාතය 0.05 කින් අඩුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර නියෝජිතවරයාට සංස්ථාවේ සේවකයන් හිරිහැර කිරීම, රු.7,316,876 ක් වැයකර යුනානි ඖෂධ මිලදී ගැනීම, රු.1,513,456 ක් වැයකර වියලි මිදි කිලෝග්‍රෑම් 2,230 ක් මිලදී ගැනීම, රු.168,000 ක් වැයකර මී ඉටි කිලෝග්‍රෑම් 200 ක් මිලදී ගැනීම, රු.1,995,000 ක් වැයකර අශුද්ධ ගුගුල් කිලෝග්‍රෑම් 1,500 ක් මිලදී ගැනීම හා යන කරුණු සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු මූලික විමර්ශන වාර්තා 2016 හා 2017 වර්ෂයන් තුළදී සංස්ථාව වෙත ලැබී තිබුණද, එම කමිටුව විසින් ලබාදී තිබුණු තීරණ 2019 මාර්තු 15 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | සිවිල් නඩුවක් පැවරීමට කටයුතු කර ඇති බව. | අමාත්‍යාංශ විමර්ශන කමිටුව විසින් ලබාදී තිබුණු තීරණ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 10 වැනි වගන්තිය සහ පනතේ 16 වැනි වගන්තිය ප්‍රකාරව නියමිත කාලය තුළදී සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නොගෙවීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව රු.1,312,002 ක අධිභාරයක් ගෙවීමට සිදුවී තිබුණි. | ඔසු උයන්වල සේවයේ යොදවා තිබුණු තාවකාලික කම්කරුවන් සඳහා සේවක අර්ථසාධක අරමුදල සඳහා දායක මුදල් ගෙවා නොතිබුණු බව හා කම්කරු දෙපාර්තමේන්තුවේ නිර්දේශවලට අනුව හිඟ මුදල් හා අධිභාරයක් ගෙවූ බව. | සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. අධිභාරයක් ගෙවීමට සිදුවීම පිළිබඳව වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව විනය බලධාරියා විසින් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | සංස්ථාවේ සේවය කර තිබුණු නිලධාරිනියක් විශ්‍රාම යාමට කළ ඉල්ලීම, ඉල්ලා අස්වීමක් ලෙස සලකා කටයුතු කර තිබුණි. ඊට එරෙහිව පවරා තිබුණු නඩුවකින් ලබාදුන් තීන්දුව ප්‍රකාරව එම නිලධාරිනිය වෙත රු.719,849 ක වන්දි මුදලක් ගෙවීමට සිදුවී තිබුණි. | සංස්ථාවේ හිටපු මානව සම්පත් කළමනාකාරිනිය 2017 වසරේ වන්දි විශ්‍රාම ක්‍රමයක් මත සේවයෙන් ඉවත්ව යාමට ඉල්ලීම් කර තිබුණු බව, නමුත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එය ඉල්ලා අස්වීමක් ලෙස පිළිගෙන ඇයගේ සේවය අවසන් කර තිබුණු බැවින් උසාවි නියෝගයක් මත හිඟ වැටුප් හා වන්දි මුදල් ගෙවීමට සිදු වූ බව. | සේවක අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි කටයුතු නොකළ වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව විනය බලධාරියා විසින් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ඉකුත් වර්ෂය තුළදී වැඩ තහනම් කරන ලද සේවකයින් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.932,090 ක ණය ශේෂ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයේ එක් නිලධරයෙකු හා සේවකයින් පස් දෙනෙකු විනය හේතූන් මත විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු සේවයෙන් පහ කරන ලද බව, ඔවුන් ලබා ගෙන තිබුණු ආපදා ණය අය කර ගෙන නොතිබුණු බව හා ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | ණය ශේෂ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2016 වර්ෂයේදී පිරිවැය රු.3,025,650 ක් වූ අර්ධ ස්වයංක්‍රීය ඖෂධ පිරවුම් යන්ත්‍රයක් මිලදීගෙන තිබුණද, එය උපයෝජනය සඳහා අත්‍යාවශ්‍ය ඖෂධ පිරවුම් කරල් (capsule) මිලදී ගැනීම 2018 ඔක්තෝබර් මාසයේදී සිදුකර තිබුණි. ඉදිරි වර්ෂ 05 කට අවශ්‍ය ඖෂධ පිරවුම් කරල් 3,100,000 ක් රු.1,516,258 ක් වැයකර මිලදී ගෙන තිබුණු නමුත් 2019 මාර්තු 21 දින වන විටත් යන්ත්‍රය භාවිතයට ගෙන නොතිබුණු අතර 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළදී ඖෂධ පිරවුම් කරල් පිරවීම සඳහා සංස්ථාව විසින් බාහිර ආයතනයක් වෙත රු.2,742,256 ක් ගෙවා තිබුණි. | 2019 මාර්තු 30 දින වන විට ඖෂධ පිරවුම් කරල් 438,000 ක් භාවිතාකොට ඇති බව, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඇති වූ ප්‍රමාදයන් නිසා Capsule තොගය 2018 වසරේ අග භාගයේ දී සංස්ථාවට ලැබී තිබුණු බව, එතැන් සිට මෙම යන්ත්‍රයේ Capsule නිෂ්පාදනය කිරීම මේ දක්වා නොකඩවාම සිදු කරන බව. | ඖෂධ පිරවුම් කරල් පළමු තොග නිකුතුව 2019 අප්‍රේල් 24 දින සිදු කර තිබුණු බැවින් සාවද්‍ය අදහස් දැක්වීම් නොකළ යුතුය. නිසි සැලැස්මකට අනුව යන්ත්‍රය හා ඖෂධ පිරවුම් කරල් උපයෝජනය කළ යුතුය. |
| (ඊ) | රාජ්‍ය අංශයට ණයට විකුණුම් සඳහා ණය කොන්දේසි පිළියෙල කර නොතිබුණු අතර 2018 දෙසැම්බර් 31 දිනට රු.183,766,205 ක් වූ රාජ්‍ය අංශ ණය අයකර ගැනීම මන්දගාමී හා දුර්වල තත්ත්වයක පැවතුණි. | රාජ්‍ය අංශයට ණයට විකුණුම් සඳහා ණය කොන්දේසි ඉදිරියේදී පිළියෙල කරන බව. | රාජ්‍ය අංශයට ණයට විකුණුම් සඳහා ණය කොන්දේසි පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (උ) | ජංගම අලෙවියට අදාළ ණය කොන්දේසිවලට පටහැනිව ණයට විකුණුම් සිදුකර තිබීමෙන් 2018 දෙසැම්බර් 31 දින වන විටත් පියවා ගත නොහැකිව තිබුණු මුළු ණය ශේෂය රු.6,710,624 ක් විය. | වර්තමාන තත්ත්වය අනුව අවශ්‍ය ණය කොන්දේසි යෝජනා ඉදිරියේදී පිළියෙල කරන බව. | ජංගම අලෙවියට අදාළ ණය කොන්දේසි සුදුසු පරිදි සංශෝධනය කිරීමට හා සියළු ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවන ලෙස පිළියෙල කර තිබුණු සමාලෝචිත වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්මට භාණ්ඩාගාර ප්‍රතිපාදනවලට සීමාවූ ක්‍රියාකාරකම් පමණක් ඇතුළත් කර තිබුණි. සංස්ථාවේ අරමුදලින් සපයාගනු ලබන අනෙකුත් මූලධන වියදම් එයට ඇතුළත් කර නොතිබුණි. ක්‍රියාකාරී සැලැස්මට අනුගත වන පරිදි 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි. | ප්‍රමුඛතා පදනම මත පිළියෙල කරනු ලබන ක්‍රියාකාරකම් සැලැස්මක් ඉදිරි වර්ෂවලදී පිළියෙල කිරීමට කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම නියමිත කාලරාමුව තුළ විධිමත් ලෙස පිළියෙල කළ යුතු අතර ක්‍රියාකාරී සැලැස්මට අනුගත වන පරිදි ප්‍රගති වාර්තා පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 100 ක් වූ ප්‍රාග්ධන ක්‍රියාකාරකම් 10 න් ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 95 ක් වූ ක්‍රියාකාරකම් 09 ක් 2019 මාර්තු 15 දින වන විටත් ඉටුකර ගැනීමට සංස්ථාව අපොහොසත්වී තිබුණි. කෙසේ වෙතත් 2018 දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය නොකළ භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු මුදල් රු.80,172,480 ක් වී තිබුණි. | මුළු ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 100 ක් වෙනුවෙන් රු.මිලියන 47 ක් පමණක් භාණ්ඩාගාරය විසින් ලබාදුන් බව, එබැවින් එම කාර්යයන් සම්පූර්ණ කිරීම ප්‍රමාද වූ බව, රස බෙහෙත් නිෂ්පාදනාගාරය ඉදිකිරීම් කටයුතු මේ වනවිට සිදු කරමින් පවතින බව. | උපයෝජනය නොකළ භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු මුදල් නිසි සැලැස්මකට අනුව උපයෝජනය කරමින් වර්ෂය සඳහා අනුමත ප්‍රාග්ධන ව්‍යාපෘති වර්ෂය තුළදී නිමකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1969 මැයි 11 දිනැති අංක 14,853/3 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කරන ලද නිවේදනය ප්‍රකාරව සංස්ථාවේ අරමුණු 07 ක් විය. ඒ අතරින් ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළගිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පට්ටි පවත්වාගෙන යාම, ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීම හා මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම යන අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගව පාලනය සහ මී මැසි පාලනය සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතින බව. | සංස්ථාවේ ප්‍රධාන අරමුණු ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නිමි ඖෂධ වෙනුවෙන් ප්‍රමිත පිරිවැය පිළියෙල කර නොතිබුණු බැවින් සත්‍ය පිරිවැය සමඟ සසඳා විචලතාවයන් හඳුනා ගැනීමට හා පිළියම් යෙදීමට නොහැකිවී තිබුණි. | ප්‍රමිත පිරිවැය පිළියෙල කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | පිරිවැයකරණ කටයුතු නිසි පරිදි සිදුවන පරිදි ක්‍රමවේදයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඉ) | එක් එක් ඖෂධයේ නිෂ්පාදන පිරිවැය හඳුනාගැනීම සඳහා එක් පොදුකාර්ය පිරිවැය අවශෝෂණ අනුපාතයක් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. ඒ වෙනුවට සියයට 45 හා සියයට 65 ලෙස අනුපාතයන් දෙකක් යටතේ පොදු කර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කර තිබුණි. | සියයට 65 ක ශ්‍රම පිරිවැය පදනම මත පොදු කාර්යය පිරිවැය අන්තර්ග්‍රහනය කරන බව. | පිරිවැයකරණ කටයුතු නිසි පරිදි සිදුවන පරිදි ක්‍රමවේදයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඊ) | සංස්ථාවේ නිෂ්පාදන සැලැස්ම හා අලෙවි සැලැස්ම ඉටු කිරීමට අදාළව සංස්ථාවේ අනෙකුත් අංශවල ක්‍රියාවලීන්හි කාර්යසාධන දර්ශක හඳුන්වාදී කාර්යසාධනය සමාලෝචනය කර නොතිබුණි. | 2018 වර්ෂයේ කාර්යසාධනය ඇගයීම සඳහා අදාළ අංශයන් වෙත කාර්යසාධන තොරතුරු ඇතුළත් ආකෘති පත්‍ර සපයා ඇති බව. | සංස්ථාවේ එක් එක් අංශවල ක්‍රියාවලීන්හි කාර්යසාධන දර්ශක හඳුන්වාදී කාර්යසාධනය සමාලෝචනය කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු වාර්ෂික නිෂ්පාදන සැලැස්මට අනුව, නව නිෂ්පාදන නොවන නිෂ්පාදන 13 ක අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය පිළිවෙලින් කිලෝග්‍රෑම් 17,291 කින් හා මිලි ලීටර් 750 බෝතල් 338,536 කින්ද, නව නිෂ්පාදන 36 ක අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය පිළිවෙලින් කිලෝග්‍රෑම් 3,904 කින් හා ඒකක 255,804 කින්ද ළඟාකර ගැනීමට නොහැකි වී තිබුණි. | පුරෝකතනයන් හා පවතින නිෂ්පාදන පහසුකම් සැලකිල්ලට ගනිමින් වාර්ෂික නිෂ්පාදන සැලැස්ම පිළියෙල කරන බව, පාරිසරික තත්වයන්, අමුද්‍රව්‍ය සපයාගැනීමේ අපහසුතාවයන් හා ප්‍රමාදයන් හේතුවෙන් ඉලක්ක නිෂ්පාදනය ලඟා කර ගැනීමට නොහැකි වී ඇති බව, නමුත් ඉකුත් වර්ෂයට වඩා නිෂ්පාදනයේ සියයට 15.2 ක වැඩි වීමක් සිදුවී ඇති බව. | ප්‍රායෝගිකව ලඟාකර ගත හැකි ඉලක්කයන් ලබාදීමට, අමුද්‍රව්‍ය හිඟයට ස්ථිරසාර විසඳුම් සෙවීමට හා නිෂ්පාදන අංශයේ මානව හා භෞතික සම්පත් කළමනාකරණය කර ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | ඉකුත් වර්ෂයේදී රාජ්‍ය අංශය තුළ අපේක්ෂිත අලෙවි ආදායමෙන් ළඟා කර ගත නොහැකිවී තිබුණු ආදායම රු.79,984,655 ක් එනම් සියයට 15 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ළඟා කර ගත නොහැකිවී තිබුණු එම ආදායම රු.111,927,940 ක් එනම් සියයට 17 ක් දක්වා වැඩි වී තිබුණි. | අහිමි වූ ආදායම යළි ඉහළ නැංවීම සඳහා නිෂ්පාදන හා අවශ්‍ය අමුද්‍රව්‍ය හඳුනා ගැනීමට, අදාළ අංශ අතර නිසි සම්බන්ධීකරණයක් ගොඩනගමින් අලෙවි සැලැස්ම, නිෂ්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර වෙළඳපොල ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීමට කටයුතු කරන බව. | තාත්ත්වික ඇස්තමේන්තු පිළියෙල කිරීමටත්, අපේක්ෂිත අලෙවි ආදායම ලඟාකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඵ) | ඉකුත් වර්ෂයේ පෞද්ගලික අංශයේ අපේක්ෂිත ආදායමෙන් ළඟා කරගත නොහැකි වී තිබුණු ආදායම රු.256,076,592 ක් එනම් සියයට 67 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ළඟා කර ගත නොහැකි වී තිබුණු එම ආදායම රු.81,110,128 ක් එනම් සියයට 34 ක් දක්වා අඩු වී තිබුණි. නමුත් 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ පෞද්ගලික අංශයේ අපේක්ෂිත ආදායම රු.144,844,500 කින් එනම් සියයට 38 කින් අඩුවෙන් ඇස්තමේන්තු කිරීම, රාජ්‍ය අංශය සඳහා කරන ලද විකුණුම් පෞද්ගලික අංශයේ විකුණුම් ලෙස වාර්තා කිරීම හා වෛද්‍ය සේවා සැපයීමේ ආදායම අලෙවි ආදායම් ලෙස වාර්තා කිරීම එම අඩුවීමට හේතුවී තිබුණි. | අහිමි වූ ආදායම යළි ඉහළ නැංවීම සඳහා නිෂ්පාදන හා අවශ්‍ය අමුද්‍රව්‍ය හඳුනා ගැනීමට, අදාළ අංශ අතර නිසි සම්බන්ධීකරණයක් ගොඩනගමින් අලෙවි සැලැස්ම, නිෂ්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර වෙළඳපොල ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීමට කටයුතු කරන බව. | තාත්ත්වික ඇස්තමේන්තු පිළියෙල කිරීමටත්, අපේක්ෂිත අලෙවි ආදායම ලඟාකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඒ) | 2018 ජුනි සිට 2018 සැප්තැම්බර් දක්වා වූ මාස 04 ක කාලය තුළදී අලෙවි මධ්‍යස්ථාන 06 ක් මගින් රාජ්‍ය අංශය වෙත අලෙවිකර තිබුණු ඖෂධවල අලෙවි වටිනාකම රු.13,005,072 ක් වී තිබුණි. ඉන් රු.11,819,420 ක් පෞද්ගලික අංශය වෙත අලෙවි කළ ඖෂධවල වටිනාකම ලෙස ව්‍යාජ ලෙස වාර්තා කරමින් ස්ථානභාර නිලධාරීන් වෙත ලබාදී තිබුණු මාසික ඉලක්ක සාක්ෂාත් කර ගත් බවට ලේඛන පිළියෙල කර තිබුණි. | රාජ්‍ය අංශයේ විකුණුම් හා වෛද්‍ය සේවා ආදායම් වෙනම ප්‍රභවයන් ලෙස ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස අලෙවි අංශය දැනුවත් කර ඇති බව. | රාජ්‍ය හා පෞද්ගලික අංශය වෙත අලෙවිකළ ඖෂධවල අලෙවි වටිනාකම නිවැරදිව වාර්තා කළ යුතුය. ව්‍යාජ ලෙස වාර්තා පිළියෙල කරමින් මාසික ඉලක්ක සාක්ෂාත් කර ගත් බවට තහවුරු කිරීමට උත්සාහ ගත් ස්ථානභාර නිලධාරීන්ට නැවත එලෙස නොකරන ලෙසට අවවාද කළ යුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂය තුළදී රාජ්‍ය අංශය වෙත නිෂ්පාදන වර්ග 164 කට අදාළ ඒකක 260,427 ක හා මිලි ලීටර් 407,243 ක ඉල්ලුම සපුරාලිය නොහැකිවීම හේතුවෙන් සංස්ථාවට අහිමි වී තිබුණු ආදායම රු.78,372,900 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයේදී එලෙස අහිමිවී තිබුණු ආදායම රු.106,695,025 ක් වී තිබුණි. අලෙවි ප්‍රවර්ධන ප්‍රයත්නයකින් තොරව රාජ්‍ය අංශයෙන් ලැබෙන ඉල්ලුම සපුරාලිය නොහැකිවීම හේතුවෙන් නිශ්චිත වෙළඳපොල කොටස අත්හැරීයාමේ අවදානමක් පැවතුණි. | අහිමි වූ ආදායම යළි ඉහළ නැංවීම සඳහා නිෂ්පාදන හා අවශ්‍ය අමුද්‍රව්‍ය හඳුනා ගැනීමට, අදාළ අංශ අතර නිසි සම්බන්ධීකරණයක් ගොඩනගමින් අලෙවි සැලැස්ම, නිෂ්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර වෙළඳපොල ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දීමට කටයුතු කරන බව. | අලෙවි ප්‍රවර්ධන ප්‍රයත්නයකින් තොරවම සපුරාලිය හැකි රාජ්‍ය අංශයේ නිශ්චිත වෙළඳපොල කොටස ආරක්ෂාකර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | 2015 දෙසැම්බර් 31 දිනට කල් ඉකුත් වූ නිම් ඖෂධවල පිරිවැය රු.96,659 ක් පමණක් වුවද, 2016 හා 2017 වර්ෂවලදී කල් ඉකුත් වූ නිම් ඖෂධවල පිරිවැය රු.1,949,672 ක් වී තිබුණි. එම පිරිවැය 2018 දෙසැම්බර් 31 දින වන විට රු.6,370,745 ක් දක්වා වර්ධනය වී තිබුණි. | කල් ඉකුත් වූ නිම් ඖෂධ පිළිබඳ පරීක්ෂා කිරීමට කමිටුවක් මේ වන විට පත් කර ඇති බව. | මුදල් රෙගුලාසි 102 සිට 105 දක්වා වූ රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර කල් ඉකුත්වීම් සඳහා වගකිවයුතු පාර්ශවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ක) | ගබඩා කර තිබුණු වියළි ඖෂධවල ගුණාත්මකභාවය රැක ගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. මුදල් රෙගුලාසි 763 ප්‍රකාරව, ගබඩා ව්‍යවස්ථාවක් පිළියෙලකර භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. ඖෂධ තොග අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් තබාගැනීම, ඒ හේතුවෙන් විශාල තොග විනාශවීම, විනාශවූ තොග ඉවත් නොකිරීම හා විනාශවූ තොග හොඳ ඖෂධ තොග සමඟ එකට ගබඩා කර තැබීම සිදුකර තිබුණි. වියළි ඖෂධ වර්ග සතුටුදායක ලෙස ගබඩාකර නොතිබුණි. ගබඩාව ඉතා අපිරිසිදු තත්ත්වයේ පැවතුණි. | අධිකරණ වලින් ලැබෙන ඖෂධ වර්ග අවශ්‍යතාවයට වඩා වැඩියෙන් ගබඩාවී ඇති බව, විනාශයට පත් වූ ඖෂධ පිළිබඳව පරීක්ෂා කර ඒවා විධිමත් ලෙස ගබඩාවෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව, ගබඩාව පැරණි බැවින් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරමින් පවතින බව, ගබඩාව වියළි ඖෂධ ගබඩා කිරීමට සුදුසු ලෙස නිර්මාණය කර ඇති බව, දැනට වියලි මිදි, දුඹුරු සීනි හා මී පැණි නව ගබඩා සංකීර්ණයේ ගබඩා කර ඇති බව හා වියලි ඖෂධ ගබඩාව තුළින් මේ වන විට ඒවා ඉවත් කර ඇති බව. | වියළි ඖෂධවල ගුණත්වය ආරක්ෂා වන පරිදි ගබඩා පාලන ක්‍රම ස්ථාපිත කර පවත්වා ගත යුතුය. ගබඩා ව්‍යවස්ථාවක් පිළියෙලකර භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------- | ------------ |
| (අ) | විජේරාම අලෙවි මධ්‍යස්ථානය සඳහා 1996 වර්ෂයේ සිට කුලී පදනමට ලබාගෙන තිබුණු මහල් 3 කින් සමන්විත ගොඩනැගිල්ලෙහි බිම් මහල පමණක් භාවිතයට ගෙන තිබුණි. ඒ අනුව 1996 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී මෙම ගොඩනැගිල්ල වෙනුවෙන් වැයකර තිබුණු මුළු බදු කුලිය රු.16,695,000 න් රු.11,130,000 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | විජේරාම අලෙවි මධ්‍යස්ථානයේ මහල් දෙකක ඇති සියළු අබලි ද්‍රව්‍ය මේ වන විට ඉවත් කර ඇති බව, මෙම මහල් දෙක ආර්ථිකමය කටයුත්තක් ලෙස වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට සැළසුම් කර ඇති බව හා කැඳ අලෙවි සැලක්ද ඒ සමඟම ආරම්භ කිරීමට නියමිතව ඇති බව. | ගොඩනැගිල්ල ඵලදායීව උපයෝජනය කළ හැකි වන පරිදි විධිමත් වැඩපිළිවෙලක් කඩිනමින් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගාල්ල හා මාතර අලෙවි මධ්‍යස්ථාන පවත්වාගෙන යන පිළිවෙලින් රු.60,000 ක් හා රු.50,000 ක මාසික කුලී පදනම මත ලබාගෙන තිබුණු ගොඩනැගිලි දෙකෙහිම උඩු මහල් නිශ්කාර්යව පැවතුණි. | වෛද්‍ය සායනයක් පැවැත්වීමේ ශක්‍යතාවය අධ්‍යයනය කිරීමෙන් අනතුරුව එය ආරම්භ කිරීමට හෝ අඩු පිරිවැයකින් යුතු ස්ථානයක් කරා අලෙවි මධ්‍යස්ථාන රැගෙන යාමට හෝ ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | ඉහත පරිදි |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශ ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාල සටහන පිළියෙල කර නොතිබුණි. | ඉදිරියේදි නිසි පරිදි ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කරන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සීමිත ලංසු කැඳවීම් සඳහා ලබාදිය යුතු දින 21 ක අවම කාල සීමාව වෙනුවට දින 08 ක් පමණක් ලබාදී ලංසු කැඳවමින්, ලංසු විවෘත කිරීමේ වාර්තා සටහන් පවත්වා නොගනිමින් හා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින්ගෙන් රහස්‍යභාවය හා අදාළ පාර්ශව සමඟ පෞද්ගලික සම්බන්ධතා නොමැති බව පිළිබඳ ප්‍රකාශ ලබා නොගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී ඇස්තමේන්තු පිරිවැය රු.49,492,806 ක් වූ තෙල් හා දියර ඖෂධ වර්ග මිලදී ගෙන තිබුණි. කාර්යය සාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණු අතර විධිමත් ගිවිසුමකට එළඹී නොතිබුණි. කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව, රු.725,052 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණු අතර සපයා තිබුණු තෙල් වර්ග 3 ක ගුණත්වය ප්‍රමිතිය තුළ නොතිබුණු බව අනාවරණයවී තිබුණි. | අවම කාල සීමාවකදී මිල ගණන් කැඳවූ නමුත් ඉදිරි මිල ගණන් කැඳවීම්වලදී නියමිත දින ගණන් ලබා දීමට කටයුතු කරන බව, සෑම සැපයුම්කරුවකු සමඟම ගිවිසුම් අත්සන් කිරීම ප්‍රායෝගිකව අපහසු බැවින් මිල ගණන් ලේඛනයේ කොන්දේසිවලට එකඟ වන බවට අත්සන් ලබා ගෙන ඇති බව, වෛද්‍යවරුන් විසින් පරීක්ෂා කර වාර්තා ලබාදෙන බව. | ඉහත පරිදි |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.8.1(අ) මාර්ගෝපදේශයෙහි දැක්වෙන විශේෂ අවස්ථානුගත කරුණු යටතේ සැලකිය නොහැකි, සංස්ථා පරිශ්‍රයට ඉන්ටර්ලොකින් ගල් ඇතිරීම හා කාණු පද්ධතිය අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා හදිසි ප්‍රසම්පාදන ක්‍රමය අනුගමනය කර රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව කොන්ත්‍රාත්කරු ලෙස තෝරා ගෙන තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් පිළියෙල කර තිබුණු රු.6,628,735 ක් වූ ඇස්තමේන්තුවේ යථායෝග්‍ය බව පරීක්ෂා කර නොතිබුණු අතර එම ඇස්තමේන්තුව පදනම් කර ගෙන සමාලෝචිත වර්ෂය තුළදී රු.6,472,556 ක් ගෙවා තිබුණි. අතුරන ලද ගල්වල පිරිවිතරවලට අනුව තිබිය යුතු සාමාන්‍ය පීඩන ශක්තිය තහවුරු කර නොගෙන ගෙවා තිබුණු රු.4,245,740 ක් ඒ තුළ විය. | මේ වන විට මෙම කාර්ය නිම කර මාස 10 ක කාලයක් ගත වී ඇති නමුත් අතුරනු ලැබූ Interlock Blocks වලට කිසිදු හානියක් සිදු වී නොමැති බව හා ඉටු කර ඇති කාර්යයේ ප්‍රමිතිය සතුටුදායක බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. අවශ්‍ය පරීක්ෂාවන් සිදුකිරීමෙන් අනතුරුව පමණක් ගෙවීම් කළ යුතුය. |
| (ඈ) | උපදේශකවරුන් තෝරා පත්කර ගැනීම සඳහා වූ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.13.2 මාර්ගෝපදේශයේ දැක්වෙන විධිවිධාන අනුගමනය නොකර, මුළු පිරිවැය රු.30,245,000 ක් වූ නිෂ්පාදනාගාරයේ ප්‍රධාන වහලය අළුත්වැඩියා කිරීමේ කාර්යයේ උපදේශන සේවාව සලසා ගැනීමේ කොන්ත්‍රාත්තුව ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ප්‍රදානය කර තිබුණි.<br><br>පිලිවිතර වෙනස් කිරීම සඳහා ලංසුකරුවන් ගෙන එන යෝජනාවලට අනුව ප්‍රසම්පාදන අස්ථිත්වයේ අවශ්‍යතාව වෙනස්වීමක් සිදු වන්නේ නම් සියළු ලංසු ප්‍රතික්ෂේප කර නැවත ප්‍රසම්පාදනය ආරම්භ කළ යුතු වුවද ඊට පටහැනිව, අවශ්‍යතා පිලිවිතරය වූ zinc /aluminium සෙවිලි ක්‍රමය සඳහා රු.25,295,577 ක අවම ලංසුව ඉදිරිපත් කළ ලංසුකරු විසින් ඉදිරිපත් කර තිබුණු විකල්ප යෝජනාවක් වූ sandwich roofing panels සෙවිලි තහඩු ක්‍රමය දක්වා අවශ්‍යතාව සංශෝධනය කරමින් එම ලංසුව රු.30,244,767 ක් දක්වා වැඩි කර අනුමත කර තිබුණි. උපදේශකවරුන්ගේ සහතික කිරීමකින් තොරව රු.8,105,358 ක් කොන්ත්‍රාත්කරු වෙත අතුරු ගෙවීම් සිදුකර තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් පිළියෙල කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තුව සියයට 06 ක උපදේශන ගාස්තු සහිතව රු.36,570,149 ක් වූ නමුත් තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් එය සියයට 02 ක උපදේශන ගාස්තු සහිතව රු.27,251,281 ක් දක්වා සංශෝධනය කරන ලද බව, සංශෝධිත ඉංජිනේරු ඇස්තමේන්තුව ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කරන ලද බව, තාක්ෂණිකමය වශයෙන් පිළිගත හැකි අවම මිල ගණන ඉදිරිපත් කර තිබුණු ලංසුව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද බව හා එය සංශෝධිත ඉංජිනේරු ඇස්තමේන්තුවට ආසන්න අගයක් ගත් බව හා එය මුලදී ඉංජිනේරු සංස්ථාව විසින් පිළියෙල කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා රු.8,745,015 කින් අඩු අගයක් ගන්නා බව, අදාළ | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. අවශ්‍ය පරීක්ෂාවන් සිදුකිරීමෙන් අනතුරුව පමණක් ගෙවීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | | අතුරු ගෙවීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලෙසට ඉහළ කළමණාකාරීත්වයෙන් ලැබුණ උපදෙස් මත ඉදිරිපත් කරන ලද බිල්පත සහ ඉටු කරන ලද කාර්යයන් පරීක්ෂා කර සෑහීමකට පත්වී අතුරු ගෙවීම නිර්දේශ කළ බව. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------------- | ------------- |
| (අ) | අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ ආරක්ෂක නියාමක තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව පුද්ගලයින් 09 දෙනෙකු ස්ථිර පදනමින් බඳවාගෙන 2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළදී එකතුව රු.15,140,829 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | ආරක්ෂක නියාමක තනතුර සඳහා ස්ථිරව බඳවා ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව ඉල්ලීම් කළද ඒ සඳහා අනුමැතිය නොලැබුණු බව, දැනට සිටින ආරක්ෂක නිලධාරීන් 09 දෙනා එම තනතුරට පෞද්ගලික වන සේ පිහිටුවා ඇති බව, මෙම තනතුරු සඳහා නව පත්වීම් ලබා දීමට සංස්ථාවට හැකියාවක් නොමැති බව, මෙම 09 දෙනාගේ සේවය අත්‍යවශ්‍ය වන බැවින් තවදුරටත් මෙම තනතුරේම තබා ගෙන අදාළ සේවාව ලබා ගැනීම කරන බව. | අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ තනතුරු සඳහා නිසි අනුමැතියකින් තොරව සිදුකර ඇති බඳවාගැනීම් හා වැටුප් ගෙවීම් පිළිබඳව වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව විනය බලධාරියා විසින් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව ස්ථානභාර නිලධාරීන් 04 දෙනෙකු හා ඇසුරුම් පරීක්ෂක 02 දෙනෙකු සමාලෝචිත වර්ෂයේදී ස්ථිර පදනමින් බඳවාගෙන රු.2,652,744 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | අභිනවයෙන් ආරම්භ කළ අලෙවි මධ්‍යස්ථාන හතරක මෙම නිලධාරීන් සේවයේ යොදවා ඇති බව, මේ වන විට අනුමත සීමාව ඉක්මවා අතිරික්ත දෙදෙනෙකු පමණක් වන බව. | ඉහත පරිදි |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා තනතුරු 05 ක වැඩ බැලීමට එම තනතුරු සඳහා සුදුසුකම් සපුරා නොතිබුණු නිලධාරීන් 05 දෙනෙකු 2015 හා 2016 වර්ෂවලදී බඳවා ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී මුළු මුදල රු.212,712 ක් වැඩ බැලීමේ දීමනා ලෙස ගෙවා තිබුණි. | වැඩ බැලීමේ තනතුරු සම්බන්ධයෙන් වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අදාළ තීරණයන් ක්‍රියාත්මක කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව. | අනුමත කාර්ය මණ්ඩලය තුළ නොවූ තනතුරු සඳහා නිසි අනුමැතියකින් තොරව සිදුකර ඇති බඳවාගැනීම් හා වැටුප් ගෙවීම් පිළිබඳව වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVII පරිච්ඡේදයේ 8.1 හා 8.2 වගන්ති ප්‍රකාරව විනය බලධාරියා විසින් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | සහකාර සමාන්‍යාධිකාරී (පරිපාලන හා මානව සම්පත්) තනතුර සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටිය ප්‍රකාරව, මානව සම්පත් කළමනාකරණය/ නීතිය/ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධිය යන මූලික සුදුසුකම සපුරා නොතිබුණු කලා උපාධිධාරියෙකු රු.81,670 ක මාසික වැටුපක් සහිතව එම තනතුරට 2017 වර්ෂයේදී බඳවා ගෙන තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඇතුළත් වූ බව, මෙම තනතුරට අදාළ මූලික උපාධිය වෙනුවට වෙනත් උපාධියක් වුවද ආයතනයේ අවශ්‍යතාවය අනුව සලකා බැලීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දුන් බව. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවාගැනීමේ පරිපාටියේ තිබෙන සුදුසුකම් වලට අනුකූලව ඒ ඒ තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගත යුතුය. බඳවාගැනීමේ පරිපාටිය අවශ්‍ය පරිදි සංශෝධනය කර ගත යුතුය. |
| (ඉ) | කළමනාකරු (සැලසුම්) හා කළමනාකරු (සැපයුම්) යන තනතුරු දෙක සඳහා වූ බඳවාගැනීමේ පරිපාටි ප්‍රකාරව, ක්ෂේත්‍රයට අදාළ සේවා පළපුරුද්ද සපුරා නොතිබුණු නිලධාරීන් දෙදෙනෙකු එම තනතුරු දෙක සඳහා එක් අයෙකුට රු.53,175 ක මාසික වැටුප් සහිතව 2017 වර්ෂයේදී බඳවා ගෙන තිබුණි. | අදාළ ක්ෂේත්‍රය සඳහා පළපුරුද්ද නොමැති වුවද සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වූ හැකියාවන් හා ක්‍රියාකාරකම් අනුව බඳවා ගත් බව හා අදාළ ක්ෂේත්‍රයේ වසර තුන වෙනුවට මාණ්ඩලික ශ්‍රේණියේ වසර තුන සැළකිල්ලට ගනිමින් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇති බව. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවාගැනීමේ පරිපාටියේ තිබෙන සුදුසුකම් වලට අනුකූලව ඒ ඒ තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගත යුතුය. බඳවාගැනීමේ පරිපාටිය අවශ්‍ය පරිදි සංශෝධනය කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර සඳහා වූ බඳවාගැනීමේ පරිපාටියට අනුව තිබිය යුතු රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය ආයතනයක කළමනාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වර්ෂ 12 ක සේවා පළපුරුද්ද සපුරා නොතිබුණු නිලධාරියෙකු එම තනතුර සඳහා රු.81,670 ක මාසික වැටුප් සහිතව 2017 වර්ෂයේදී බඳවා ගෙන තිබුණි. | සම්මුඛ පරීක්ෂණයේ දී ඉහළ සුදුසුකම් ලැබූ අයදුම්කරු සහකාර සාමාන්‍යාධිකාරී (මූල්‍ය) තනතුර සඳහා බඳවා ගත් බව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති බව. | ඉහත පරිදි |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-----------------------------------------

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

-------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ----------------- | ------------- |
| යාවත්කාලීන කරන ලද ආයතන සංවිධාන ව්‍යුහය, අනුමත කාර්යය මණ්ඩලය, දැනට සිටින කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර, වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා පදනම මත පිළියෙල කළ වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), එය ක්‍රියාත්මක කාල රාමුව හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම / ප්‍රතිඵල යනාදී විස්තර සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. තවද භාණ්ඩාගාර ප්‍රතිපාදනවලට සීමාවූ ක්‍රියාකාරකම් පමණක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණු අතර සංස්ථාවේ අරමුදලින් සපයාගනු ලබන අනෙකුත් මූලධන වියදම් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. එසේම ක්‍රියාකාරී සැලැස්මට අනුගත වන පරිදි 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබුණි. | ප්‍රමුඛතා පදනම මත පිළියෙල කරනු ලබන ක්‍රියාකාරකම් සැලැස්මක් ඉදිරි වර්ෂවලදී පිළියෙල කිරීමට කටයතු කරන බව. | ක්‍රියාකාරී සැලැස්ම විධිමත් ලෙස පිළියෙලකර ක්‍රියාත්මක කළ යුතු අතර ප්‍රගතිය ක්‍රියාකාරී සැලැස්මට අනුගත වන පරිදි පිළියෙල කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

---------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ------------------ | ------------ |
| සමාලෝචිත වර්ෂයට අදාළ සමස්ත ආදායම් අයිතම 07 ක අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර සියයට 22 සිට සියයට 24 දක්වා පරාසයකද සහ වියදම් අයිතම් 32 කින් වියදම් අයිතම 13 ක අයවැයගත වියදම හා තත්‍ය වියදම අතර සියයට 13 සිට සියයට 778 දක්වා පරාසයක අවාසිදායක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගත යුතුය. |

## 4.3 වෙළඳපොල කොටස

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආයතනය විසින් තම වෙළඳපොල කොටස තීරණය කිරීම සඳහා කාලීනව වෙළඳපොල සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර තරඟකාරී ආයතන අතර ආයතනයේ වෙළඳපොල කොටස අඩුවීමක් හෝ වැඩිවීමක් සිදුවී තිබේද යන්න පිළිබඳ අවබෝධයක් ආයතනය සතුව නොතිබුණි. | වෙළඳපල සමීක්ෂණයක් පැවැත්වීම සඳහා කටයුතු කරන බව. | සංස්ථාව විසින් කාලීනව වෙළඳපොළ සමීක්ෂණයන් සිදුකර ආයුර්වේද ඖෂධ වර්ගවලට අදාළ වෙළඳපොළ කොටස හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4.4 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශක හඳුනාගත යුතු වුවද, සංස්ථාව විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ළඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළයුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව. | 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |